| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 8 ශ්‍රේණිය | **කතෝලික ධර්මය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

## I කොටස

- **මෙම කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ස්නාවක ජොහාන්තුමා විසින් ප්‍රසිද්ධියේම වරද පෙන්වා දෙනු ලැබුවේ කාගේද?
   i. මහ හෙරෝද්ගේ ය
   ii. හෙරෝද් අග්‍රිපාගේ ය
   iii. හෙරෝද් ඇන්ටිපස්ගේ ය
   iv. හෙරෝද් පිලිප්ගේ ය

2. ''පුරාණ ගිවිසුමේ යාග පූජාවලට ගවයා භාවිතා වූ නිසා ............... ශුභාරංචියේ සංකේතය ගවයා වේ.'' හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
   i. ශුද්ධ වූ මාක්
   ii. ශුද්ධ වූ ලූක්
   iii. ශුද්ධ වූ මතෙව්
   iv. ශුද්ධ වූ ජොහාන්

3. ජේසුස් වහන්සේගේ වංශාවලිය ආදී පිතෘ ආබ්‍රහම්තුමාගෙන් ආරම්භ කර ඇති ශුභාරංචිය වන්නේ,
   i. ශුද්ධ වූ මාක් ශුභාරංචිය
   ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය
   iii. ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය
   iv. ශුද්ධ වූ ජොහාන් ශුභාරංචිය

4. ''මාගේ අසල්වැසියා කවරෙක්දැයි'' එක්තරා විනයධරයෙක් නැගූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ජේසුස් වහන්සේ වදාළ උපමාව වන්නේ,
   i. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව
   ii. වපුරන්නා පිළිබඳ උපමාව
   iii. යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව
   iv. නිධානය පිළිබඳ උපමාව

5. ජේසුස් වහන්සේ හෙවත් මෙසියස් වහන්සේ උපත ලබන්නේ බෙත්ලෙහෙමේ බවට දිවැස් වැකි ඉදිරිපත් කරන ලද දිවැසිවරයා කවුරුන්ද?
   i. යෙසායා දිවැසිවරයා
   ii. එසකියෙල් දිවැසිවරයා
   iii. සාමුවෙල් දිවැසිවරයා
   iv. මීකා දිවැසිවරයා

6. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
   i. ගලීලයෙනි
   ii. සමාරියෙනි
   iii. ජුදයාවෙනි
   iv. බෙතානියෙහි

7. ''දැනටමත් පොරව ගස් මුල්වලට එල්ල කර ඇත'' මෙම ප්‍රකාශය සිදුකරන ලද්දේ,
   i. ජේසුස් වහන්සේ විසිනි
   ii. සෙකරියස්තුමා විසිනි
   iii. ස්නාවක ජොහාන්තුමා විසිනි
   iv. ගාබ්‍රියෙල් දේවදූතයා විසිනි

8. දාවිත් රජ පරපුරෙන් ලෝක ගැළවුම්කරුවාණන් පැමිණෙන බව දාවිත් රජුට දක්වනු ලැබුවේ,
   i. යෙසායා දිවැසිවරයා විසිනි
   ii. නාතාන් දිවැසිවරයා විසිනි
   iii. එළියා දිවැසිවරයා විසිනි
   iv. එසකියෙල් දිවැසිවරයා විසිනි

9. ''මා සිහි කිරීම පිණිස මෙය කරන්නැයි'' ජේසුස් වහන්සේ පැවසුවේ,
   i. කුරුස ගසේ දී
   ii. බෞතිස්ම ස්නාපනයේදී
   iii. ශ්‍රාවකයන් තෝරා ගැනීමේදී
   iv. අන්තිම රාත්‍රී භෝජනයේදී

10. ජේසුස් වහන්සේ නාසරෙත් නුවර ධර්මශාලාවේදී තම දූත කාර්යය පිළිබඳව ප්‍රකාශ කිරීමට යොදාගත් ග්‍රන්ථය වන්නේ,
   i. යෙසායා ග්‍රන්ථයයි
   ii. නික්මයාම ග්‍රන්ථයයි
   iii. ජෙරමියා ග්‍රන්ථයයි
   iv. එසකියෙල් ග්‍රන්ථයයි

11. ''පරමෝත්තම දෙවියන්ගේ පුත්‍ර වූ ජේසුස් වහන්ස, ඔබත් මාත් අතර මොන ගනුදෙනුවක්ද?'' මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ,
   i. පේදුරුතුමන් විසිනි
   ii. සකේවුස් විසිනි
   iii. දුෂ්ටාත්ම ආවේශ වූ මිනිසා විසිනි
   iv. කුදු ස්ත්‍රිය විසිනි

12. ජේසුස් වහන්සේගේ වචනවල සහ දේශනාවල හරය වනුයේ,
   i. මනස්ථාපනයයි
   ii. දේව රාජ්‍යයේ උදාවයි
   iii. දේව ප්‍රේමයයි
   iv. මනුෂ්‍ය ජීවිතයේ උතුම්කමයි

13. ජේසුස් වහන්සේ පාලුකරයේ ……….. නිරාහාරව යාච්ඤා කළ සේක. හිස්තැනට සුදුසු වරණය වන්නේ,
   i. දින 7ක්
   ii. දින 21ක්
   iii. දින 40ක්
   iv. දින 50ක්

14. දෙවියන් වහන්සේට ''අබ්බා පියාණෙනි'' යනුවෙන් ඇමතිමට හැකිවන දේව ප්‍රසාද නිධානය වන්නේ,
   i. අභිවෘද්ධි ආලේපයයි
   ii. ප්‍රසාද ස්නාපනයයි
   iii. සමගි සන්ධානයයි
   iv. දිව්‍ය සත්ප්‍රසාදයයි

15. විශ්වය ශුද්ධවත් කිරීමේ කාර්යය පැවරී ඇත්තේ,
   i. පියාණන් වහන්සේටය
   ii. ශුද්ධාත්මයාණන් වහන්සේටය
   iii. පුත්‍රයාණන් වහන්සේටය
   iv. ජේසුස් වහන්සේටය

16. ''එතුමන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි.'' මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ,
   i. ස්නාවක ජොහාන්තුමා විසිනි
   ii. ජෙරමියා දිවැසිවරයා විසිනි
   iii. පේදුරුතුමා විසිනි
   iv. සකේවුස් විසිනි

17. දෙවියන් වහන්සේ කී දෙය අවිශ්වාස කළ බැවින් ගොලු බවට පත් වූයේ,
   i. ආබ්‍රහම්තුමා ය
   ii. සිමියොන් තුමාය
   iii. සෙකරියස් තුමාය
   iv. ජුසේතුමා ය

18. ශුද්ධ වූ ලූක්තුමා සිය ශුභාරංචිය පිළිගන්වනු ලබන්නේ,
   i. ජේසුස් වහන්සේටය
   ii. ශ්‍රීමත් තියෝපිලස්තුමාට ය
   iii. සෙකරියස්තුමාට ය
   iv. පාවුලුතුමාට ය

19. ''එම්මානුවෙල්'' යන්නෙහි අර්ථය වන්නේ,
   i. 'ශුද්ධාත්මයාණන් අප සමඟය'
   ii. 'දෙවියන් වහන්සේ අප සමඟය'
   iii. 'දෙවියන් වහන්සේ ගළවන සේක'
   iv. 'දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක'

20. අභිවෘද්ධි ආලේපනය තුළින් අප ලබන ශුද්ධාත්ම දීමනා ගණන වන්නේ,
   i. 12 කි
   ii. 21 කි
   iii. 14 කි
   iv. 7 කි

(ල. 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1.

   i. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි සඳහන් වන ජේසුස් වහන්සේගේ ළමාවිය පිළිබඳ කරුණු 02ක් ලියන්න.

   ii. දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳව ඉගැන්වෙන උපමා 02ක් ලියන්න.

   iii. ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය අනාවරණය වූ අවස්ථාවක් සඳහන් කරන්න.

   iv. ශුද්ධාත්ම ඵල 02ක් නම් කරන්න.

   v. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි පරමාර්ථය සඳහන් කරන්න.

   vi. ජේසුස් වහන්සේ ජෙරුසලමෙහි කළ සේවාවන් 02ක් ලියන්න.

   vii. ස්නාවක ජොහාන්තුමා අනුශාසනා ලබා දුන් ජන කොටස් 02ක් නම් කරන්න.

   viii. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 02ක් ලියන්න.

   ix. දිව්‍ය සත්ප්‍රසාදයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේ ලබාගත් ඔබ කරන යහපත් ක්‍රියා 02ක් ලියන්න.

   x. දේව සැලැස්මට අනුගාමීවීමට ඔබව කළ හැකි දේවල් 02ක් ලියන්න.

(ලකුණු 2×10=20)

2.

   i. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ 2ක් ලියන්න. (ල. 2)

   ii. දිව්‍ය සත්ප්‍රසාදයේ පූර්ව සලකුණු 03ක් ලියන්න. (ල. 3)

   iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ශාරීරික සූදානම යනු කුමක්දැයි විස්තර කරන්න. (ල. 5)

3.

   i. පුරාණ ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ හැඳින්වීමට භාවිතා කර ඇති යෙදුම් 02ක් ලියන්න. (ල. 2)

   ii. ශුද්ධාත්ම දීමනා 03ක් ලියන්න. (ල. 3)

   iii. ශුද්ධාත්ම වරම් පතා යාච්ඤාවක් ලියන්න. (ල. 5)

4.

   i. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 02ක් ලියන්න. (ල. 2)

   ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි සඳහන් වන කාන්තා චරිත 03ක් ලියන්න. (ල. 3)

   iii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙන් ඔබගේ ජීවිතයට ලැබෙන පණිවුඩ 05ක් ලියන්න. (ල. 5)

5.

i. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග 2 ක් නම් කරන්න. (ල. 2)

ii. අපගේ ජීවිත තුළ ප්‍රාතිහාර්යයන් අත්දැකීමට කටයුතු කළ ආකාර 03ක් ලියන්න. (ල. 3)

iii. ලෙඩරෝග වලින් පෙළෙන්නන්ට සුවය පතා කිව හැකි යාච්ඤාවක් ලියන්න. (ල. 5)

6.

i. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය ලබන්නට ලැබෙන දීමනා 2 ක් ලියන්න. (ල. 2)

ii. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් 3 ක් ලියන්න. (ල. 3)

iii. ඔබ යහපත් කිතුණුවෙකු ලෙස මීසම තුළ ක්‍රියා කළ හැකි ආකාර 5 ක් ලියන්න. (ල. 5)

7.

i. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි සඳහන් ප්‍රශංසා ගීත 02 ක් ලියන්න. (ල. 2)

ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි සඳහන් ජුදා ආගමික වත්පිළිවෙත් 3 ක් ලියන්න. (ල. 3)

iii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියෙහි කතුවරයා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)